ද මැසිනොද් විදුහල - කඳාන | පළමුවන වාර පරීක්ෂණය
12 වසර වාණිජ සහ කලා ශ්‍රේණි සඳහා | 2016 ජුලි

ආර්ථික විද්‍යාව - I | පැය 02

12 තුන්වන වාරය . 27.07.2016

බහුවරණ ප්‍රශ්නවල එක් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ පිළිතුරක් ඇත. එය තෝරා යටින් ඉරක් අඳින්න. සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

Learning Resource Center
De Mazenod College
Kandana

1. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සූක්ෂම ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශනයක් වනුයේ කවරක් ද?
   (1) පසුගිය වසරේ දී රබර් මිල 10% කින් පහළ වැටුණි.
   (2) පසුගිය වසරේ දී විරැකියාව ශ්‍රම හමුදාවෙන් 5.8%ක් වුයේ ය.
   (3) පසුගිය වසරේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 7%කින් ඉහළ ගියේය.
   (4) පසුගිය වසරේ දී පොදු මිල මට්ටම 4% කින් වැඩි විය.
   (5) පසුගිය වසරේ දී රජයේ බදු අයභාරය 8% කින් අඩු විය.


2. ආර්ථික පද්ධතියක් තුළ තීරණ ගනු ලබන ප්‍රධාන කණ්ඩායම් තුන වනුයේ,
   (1) කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ බැංකු වේ.
   (2) කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ රජය වේ.
   (3) ව්‍යාපාරික ආයතන, රජය සහ රාජ්‍ය නොවන සංවිධාන වේ.
   (4) ව්‍යාපාරික ආයතන, බැංකු සහ විදේශ වෙළඳාමේ නිරත වූවන් වේ.
   (5) කුටුම්බ, රජය සහ බැංකු වේ.

3. කිසියම් කටයුත්තක ආවස්ථික පිරිවැය
   (1) එබඳු කටයුතු කරන සියල්ලන්ට ම එක සමාන වේ.
   (2) ගණනය කිරීමේ දී මූල්‍ය පිරිවැය සහ කැප කරන ලද ආදායම් යන දෙකොටස ම ඇතුලත් කරගනී
   (3) එම කටයුත්තෙහි මූල්‍ය පිරිවැය පමණක් ඇතුලත් කර ගනී
   (4) එම කටයුත්ත නිසා කැප කරන්නට සිදු වූ ආදායම් පමණක් ඇතුලත් කර ගනී.
   (5) එම කටයුත්ත නිසා හටගන්නා සෘජු ප්‍රතිලාභ පමණක් මිනුම් කරයි

4. කිසියම් රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත
   (1) තාක්ෂණය වෙනස් වෙමින් පවතී
   (2) අනික් භාණ්ඩයේ නිෂ්පාදන අඩු නොකොට, කිසියම් භාණ්ඩයක් වැඩිපුර නිපදවිය හැකි ය.
   (3) නිෂ්පාදන සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය නොවේ.
   (4) පවත්නා සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය වේ.
   (5) ආර්ථිකයේ නිෂ්පාදන අකාර්යක්ෂමතාවක් පවතී.

5. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් සූක්ෂම ආර්ථික න්‍යාය ට අදාළ වන ප්‍රකාශය කුමක්ද ?
   (1) යෙදවුම් මිල ඉහළයාම මිල මට්ටම ඉහළයාමට හේතු වේ
   (2) සමස්ත නිෂ්පාදිතය පහළයාම සේවා නියුක්තිය පහළයාමට හේතු වේ.
   (3) පොළී අනුපාතිකය පහළයාම මුදල් ඉල්ලුම ඉහළයාමට හේතු වේ.
   (4) මුදල් සැපයුම ඉහළයාම පොළී අනුපාතිකය පහළයාම හේතු වේ.
   (5) ආන්තික ඵලදාව පහළ යාම, ආන්තික පිරිවැය ඉහළ යාමට හේතු වේ.

6. කිසියම් ආර්ථිකයකට අදාළ නිෂ්පාදන හැකියා මායිම් රූප සටහනක් පහත දැක්වේ.



ඉහත නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට අදාළ වඩාත් නිවැරදි ප්‍රකාශය පහත පිළිතුරු අතුරින් තෝරන්න.

(1) සමජාතීය සම්පත් නිෂ්පාදනයට යොදා ගෙන ඇත.
(2) සමාන ශිල්පීය ක්‍රමයක් නිෂ්පාදනයට යොදා ගෙන ඇත
(3) සමජාතීය නොවන සම්පත් නිෂ්පාදනයට යොදා ගෙන ඇත
(4) සම්පත්වල ඵලදායිතාවයේ වෙනසක් සිදු වී ඇත
(5) එක් කර්මාන්තයකට යෙදවූ සම්පත් අනෙක් කර්මාන්තයට ද ඒ ආකාරයෙන් ම යොදා ගත හැක.

7. සෑම ආර්ථික කටයුත්තක දී ම නිෂ්පාදන සම්පත් එකිනෙකට පූර්ණ ආදේශක වේ නම්, පහත සඳහන් ද අතුරෙන් කවරක් නිවැරදි වේ ද?

(1) සියළුම භාණ්ඩවල නිමැවුම වැඩි කළ හැකි ය
(2) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය සරල රේඛාවක් වනු ඇත
(3) විශේෂ ප්‍රාගුණ්‍යකරණය සහ අන්‍යෝන්‍යය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් හට ගැනීමට ඉඩක් නොපවතී.
(4) කිසිදු රටක් හෝ කිසිදු පුද්ගලයෙක් හෝ කිසිදු කටයුත්තක් සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි අත්කර ගැනීමට අසමත් වේ.
(5) නිෂ්පාදන සම්පත් හිඟය අහෝසි වී යනු ඇත.

8. ධනවාදය පදනම් කරගත් ආර්ථිකයක පහත දැක්වෙන එක් කරුණක් හැර අන් සියල්ල දක්නට ලැබේ. එලෙස දක්නට නොලැබෙන කරුණ වනුයේ,

(1) ඉල්ලුම හා සැපයුම මත පදනම් වූ මිල ක්‍රමයයි
(2) පෞද්ගලික දේපළ ක්‍රමයයි
(3) ස්වාර්ථය මත කටයුතු කරන කුටුම්බ සහ ව්‍යවසායකයන් ය
(4) ව්‍යවසායක නිදහසයි
(5) මධ්‍යගත සැලසුම්කරණයයි.

9. ආර්ථිකය තුළ ආණ්ඩුවේ සහභාගිත්වය වඩාත් ප්‍රබල ලෙස දක්නට ලැබෙන්නේ,

(1) වෙළඳපොල ආර්ථිකයක ය
(2) විධානගත ආර්ථිකයක ය
(3) මිශ්‍ර ආර්ථිකයක ය
(4) සමාජ වෙළඳපොළ ආර්ථිකයක (Social Market economy) ය
(5) සාම්ප්‍රදායික ආර්ථිකයක ය

10. කිසියම් පුද්ගලයෙක් ආදායම ඉහළ යන විට කිරි පිටි සඳහා කරන ඉල්ලුම වැඩි කරයි නම්, කිරිපිටි

(1) බාල භාණ්ඩයකට උදාහරණයක් වේ
(2) ආර්ථික නොවන භාණ්ඩයකට උදාහරණයක් වේ
(3) ගිෆන් භාණ්ඩයකට උදාහරණයක් වේ
(4) පොදු භාණ්ඩයකට උදාහරණයක් වේ
(5) සාමාන්‍ය භාණ්ඩයකට උදාහරණයක් වේ

11. මධ්‍යගත සැලසුම් ආර්ථිකයක මිල මගින් ඉටු කෙරෙන කාර්යයක් වනුයේ,

(1) නිපදවිය යුතු භාණ්ඩ කවරේද යන්න පිළිබඳව මධ්‍යගත සැලසුම් මණ්ඩලයට මග පෙන්වීමයි
(2) නිෂ්පාදකයින්ට ලාභ උපයා දීම මගින් සානුබල සැපයීමයි
(3) හිඟ සම්පත් විකල්ප අරමුණු අතර සලාක කිරීමයි
(4) ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මෙවලමක් වීමයි
(5) කුටුම්බ අතර සාධක ආදායම් ව්‍යාප්තිය තීරණය කිරීමයි

12. "වෙළඳපොළ ආර්ථික පද්ධතිය තුළ පාරිභෝගික ස්වාධිපත්‍යයක් ඇත." යන්න පහත සඳහන් කවර කරුණ මගින් පැහැදිළි කළ හැකිද?

(1) පාරිභෝගිකයින් ඉල්ලුම් කරන භාණ්ඩ වෙළෙඳපොළ මගින් සැපයීම
(2) පාරිභෝගිකයින්ට අත්‍යාවශ්‍ය භාණ්ඩ පමණක් සැපයීමට රජය මග පෙන්වීම
(3) තම කැමැත්ත පරිදි ශ්‍රමය සංචලනය කිරීමට ශ්‍රමිකයාට නිදහස තිබීම
(4) පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා රජය මිල පාලනයේ යෙදීම
(5) ස්වභාවික ඒකාධිකාරී තත්වයක් වෙළඳපොලේ පැවතීම

21-07-2016 12 ශ්‍රේණිය ආර්ථික විද්‍යාව

13. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත සෑම ලක්ෂයකදීම අපේක්ෂා කළ හැකි තත්ත්වයක් වන්නේ,
(1) සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාවයයි
(2) ආර්ථික කාර්යක්ෂමතාවයයි
(3) නිෂ්පාදන කාර්යක්ෂමතාවයයි
(4) මිල ස්ථායිතාවයයි
(5) නිෂ්පාදිතය බෙදී යාමේ සාධාරණතත්වයයි

14. සලකා බලන භාණ්ඩයක මිල වැඩි වීමකදී එහි ඉල්ලුම් ප්‍රමාණය අඩුවීමට බලපාන ආදායම් ප්‍රතිවිපාකය වන්නේ,
(1) සාපේක්ෂ මිල අඩු භාණ්ඩ වෙතට පාරිභෝගිකයින් මාරු වීමයි.
(2) භාණ්ඩයේ මිල වැඩිවීමකදී මූර්ත ආදායම ඉහළ යාමයි.
(3) භාණ්ඩයේ මිල වැඩිවීමකදී මූර්ත ආදායම පහල යාමයි.
(4) සලකා බලන භාණ්ඩයේ මිල, අනාගතයේදී අඩුවෙතැයි අපේක්ෂාවෙන් එහි ඉල්ලුම අඩු කිරීමයි.
(5) භාණ්ඩයේ මිල වැඩිවීමකදී මුලා ආදායම අඩුවී ඉල්ලුම අඩු වීමයි.

15. යමකිසි භාණ්ඩයක වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් රේඛීය ශ්‍රිතයන් වන අතර ඒවාට අදාළ ලක්ෂ්‍ය කීපයක් පහත දැක්වේ.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 1 | 27.5 | 2.5 |
| 2 | 25.0 | 5.0 |
| 3 | 22.5 | 7.5 |
| 4 | 20.0 | 10.0 |

මෙම භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය වන්නේ පිළිවෙලින්,
(1) රු. 3 හා ඒකක 10 කි (2) රු. 6 හා ඒකක 15 කි. (3) රු. 8 හා ඒකක 20 කි.
(4) රු. 9 හා ඒකක 25 කි. (5) රු. 10 හා ඒකක 30 කි.


16. කිසියම් භාණ්ඩයක් සම්බන්ධව වෙළෙඳපොළ සමතුලිතයේ දී ඇති විය හැකි අනිවාර්ය කොන්දේසිය වන්නේ,
(1) නිෂ්පාදන අතිරික්තය හා පාරිභෝගික අතිරික්තය සමාන වීම ය
(2) අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල සමාන වීම ය
(3) අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල ශුන්‍ය වීම ය
(4) අධි ඉල්ලුම් ප්‍රමාණය හා අධි සැපයුම් ප්‍රමාණය සමාන වීම ය
(5) නිෂ්පාදන අතිරික්තය හා පාරිභෝගික අතිරික්තය ශුන්‍ය වීම ය

17. කිසියම් කුඩා රටක සීනි සඳහා දේශීය වෙළඳපොළේ පවත්නා ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පිළිවෙළින් පහත සඳහන් සමීකරණ පෙන්නුම් කරයි.
$Q_d = 320 - 3P$ (ඉල්ලුම) $Q_s = -80 + 2P$ (සැපයුම)

තව ද එම රටේ සීනි වෙළෙඳපොළ ජාත්‍යන්තර වෙළෙඳාමට විවෘත බවත්, සීනි ඒකකයක ලෝක වෙළෙඳපොළ මිල රු. 60ක් වන බවත් සලකන්න. විදේශ වෙළෙඳාමට විවෘතව ඇති තත්ත්වය යටතේ, වෙළෙඳපොළට දේශීය වශයෙන් සපයනු ලබන සීනි ප්‍රමාණය කොපමණ වේද?
(1) ඒකක 40 (2) ඒකක 60 (3) ඒකක 80
(4) ඒකක 100 (5) ඒකක 140

18. පෙට්‍රල් සඳහා පවත්නා ඉල්ලුම අතිශයින් අනම්‍ය බවත් එහි සැපයුම අතිශයින් නම්‍යබවත් සලකන්න. මෙම තත්ත්වය යටතේ පෙට්‍රල් මත නිෂ්පාදන බද්දක් පනවනු ලැබුවහොත් බදු බර,
(1) ඉතා විශාල වශයෙන් ගැනුම්කරුවන් විසින් දරනු ලැබේ.
(2) ඉතා විශාල වශයෙන් විකුණුම්කරුවන් විසින් දරනු ලැබේ.
(3) ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විසින් සමසමව දරනු ලැබේ
(4) මුළුමනින් ම අය බදු ගෙවන්නෝ දරති
(5) ගැනුම්කරුවෝ හෝ විකුණුම්කරුවෝ හෝ නොදරති

19. කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා පවත්නා තරඟකාරී වෙළෙඳපොළක, ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර මෙම ප්‍රස්තාර සටහන පෙන්නුම් කරයි.




මෙම භාණ්ඩයේ නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවශ්‍යතාව නිසා, නිමවුම් ඒකකයකට රු. 2ක් වන සේ සහනාධාරයක් නිෂ්පාදකයන්ට ලබා දීමට රජය තීරණය කරයි. සහනාධාර ලබා දුන් පසුව පාරිභෝගික අතිරික්තයේ ප්‍රමාණය

(1) රු. 20 කි (2) රු. 80 කි (3) රු. 90 කි
(4) රු. 160 කි (5) රු. 180 කි

20. යම් දෙන ලද අවස්ථාවක, තරඟකාරී වෙළඳපොලක, 'සාමාන්‍ය භාණ්ඩයක්' සඳහා ඉල්ලුම වැඩි වී සැපයුම අඩු වුවහොත් ,

(1) සමතුලිත මිල පහළ වැටෙන අතර සමතුලිත ප්‍රමාණය ඉහළ නගී
(2) සමතුලිත මිලත් ප්‍රමාණයත් දෙක ම ඉහළ නගී
(3) සමතුලිත ප්‍රමාණය ඉහළ නගී. සමතුලිත මිල ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන
(4) සමතුලිත මිල පහළ බසී. සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන
(5) සමතුලිත මිල ඉහළ නගී. සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන

21. කිසියම් භාණ්ඩයක මිල වැඩිවන විට ඒ භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය ඉහළ යන්නේ නම් එය,

(1) බාල භාණ්ඩයකි (2) ආදේශන භාණ්ඩයකි
(3) අනුපූරක භාණ්ඩයකි (4) සාමාන්‍ය භාණ්ඩයකි
(5) ගිෆන් භාණ්ඩයකි

22. X යනු බාල භාණ්ඩයකි. පාරිභෝගික ආදායම පහළ යන විට,

| | X භාණ්ඩයේ මිල | X භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය | X භාණ්ඩයේ ඉල්ලුම |
|---|---|---|---|
| (1) | අඩු වේ | වැඩි වේ | වැඩි වේ |
| (2) | වැඩි වේ | අඩු වේ | වැඩි වේ |
| (3) | වැඩි වේ | වැඩි වේ | වැඩි වේ |
| (4) | වැඩි වේ | අඩු වේ | අඩු වේ |
| (5) | අඩු වේ | වැඩි වේ | අඩු වේ |

23. ශ්‍රී ලංකාවේ සීනි සඳහා පවත්නා දේශීය වෙළෙඳපොලේ ඉල්ලුම් සැපයුම් වක්‍ර පහත දැක්වේ.

$Q_d = 320 - 3P$ (ඉල්ලුම) $Q_s = 80 + 2P$ (සැපයුම)

ලෝක වෙළඳපොළේ සීනි කිලෝවක මිල රු. 50 ක් වේ. මේ මිලේ දී ශ්‍රී ලංකාව කොපමණ සීනි ආනයනය කරන්නේද?

(1) ඒකක 20 (2) ඒකක 40 (3) ඒකක 60
(4) ඒකක 80 (5) ඒකක 0

24. කිසියම් භාණ්ඩයක ඉල්ලුම අතිශයින් අනම්‍ය බවත් සැපයුම පූර්ණ නම්‍ය බවත් සිතන්න. මෙ භාණ්ඩය මත නිෂ්පාදන බද්දක් පනවනු ලැබුවහොත් බදු බර,

(1) ඉතා විශාල ප්‍රමාණයක් ගැනුම්කරුවන් දරයි
(2) ඉතා විශාල ප්‍රමාණයක් සැපයුම්කරුවන් දරයි
(3) මුළු බදු බැර ම සැපයුම්කරුවන් දරයි
(4) මුළු බදු බර ම ගැනුම්කරුවන් දරයි.
(5) ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් සම සමව දරයි


25. කෘෂි කාර්මික භාණ්ඩයක් සඳහා පවත්නා තරඟකාරී වෙළෙඳපොලක ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර වල සමීකරණ පහත දැක්වේ.

$Q_d = 120 - 20P$ $Q_s = -40 + 20P$

මෙම භාණ්ඩයේ නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවශ්‍යතාව නිසා නිමැවුම් ඒකකයකට රුපියල් 2 ක් වන සේ සහනාධාරයක් නිෂ්පාදකයන්ට ලබා දීමට රජය තීරණය කරයි. සහනාධාරය ලබා දුන් පසුව පාරිභෝගික අතිරික්තයේ ප්‍රමාණය,

(1) රු. 90 කි (2) රු. 60 කි (3) රු. 112.50 කි
(4) රු. 180 කි (5) රු. 225 කි

26. පහත දැක්වෙන්නේ කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක විචල්‍ය යෙදවුම් වැඩිකරන විට, ආන්තික ඵලදාව හා සාමාන්‍ය ඵලදාව වෙනස් වන ආකාරයයි.





ඉහත රූප සටහනේ $L_1$ සිට $L_2$ දක්වා විචල්‍ය යෙදවුම් වැඩි කරත්ම කෙටි කාලීන සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා ආන්තික පිරිවැය වෙනස් වන ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

| | සාමාන්‍ය විචල්‍ය පිරිවැය | ආන්තික පිරිවැය |
|---|---|---|
| (1) | පහළ යයි | පහළ යයි |
| (2) | පහළ යයි | ඉහළ යයි |
| (3) | ඉහළ යයි | ඉහළ යයි |
| (4) | ඉහළ යයි | පහළ යයි |
| (5) | ඉහළ යයි | ස්ථාවරව පවතී |


27. මෙම රූපසටහනේ දැක්වෙන ආයතනය සම්බන්ධයෙන් ඔබට එකඟ විය හැකි ප්‍රකාශය තෝරන්න.

(1) ආයතනයේ ලාභ උපරිම වන්නේ $E_1$ ලක්ෂ්‍යයට අදාළ නිමැවුම් මට්ටමේ දිය.
(2) E ලක්ෂ්‍යයට අදාළ නිමැවුම් මට්ටමේ දී ආයතනය ආර්ථික ලාභයක් උපයනු ලබයි.
(3) E ලක්ෂ්‍යයට අදාළ නිමැවුම් මට්ටමේ දී ආයතනය අලාභයක් උපයනු ලබයි
(4) ආයතනයේ කෙටිකාලීන සැපයුම් වක්‍රය, E ලක්ෂ්‍යයේ සිට ඉහළට බෑවුම්වන ආන්තික පිරිවැය වක්‍රය වේ.
(5) ආයතනයේ අවම සැපයුම් මිල P වේ.




28. කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියක යෙදවුම් හා නිමැවුම් අතර සම්බන්ධය පහත දැක්වේ,
ඉහත කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ L1 යෙදවුම් මට්ටමේ දී

(1) ආන්තික ඵලදායිතාව ඍණ අගයක් ගනී
(2) සාමාන්‍ය ඵලදායිතාව ශුන්‍ය වේ
(3) ආන්තික ඵලදායිතාව ශුන්‍ය වේ
(4) ආන්තික ඵලදායිතාව හා සාමාන්‍ය ඵලදායිතාව සමාන වේ
(5) ආන්තික ඵලදායිතාවට වඩා සාමාන්‍ය ඵලදායිතාව අඩු අගයක් ගනී



29. කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියක සාමාන්‍ය විචල්‍ය පිරිවැය අවම වන නිමැවුම් මට්ටමෙන් ඔබ්බට තවදුරටත් නිමැවුම වැඩිකරත් ම,

| ආන්තික පිරිවැය (MC) | සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) | සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) |
|---|---|---|
| (1) පහළ යයි | පහළ යයි | පහළ යයි |
| (2) ඉහළ යයි | පහළ යයි | පහළ යයි |
| (3) ඉහළ යයි | පහළ යයි | ඉහළ යයි |
| (4) ඉහළ යයි | ඉහළ යයි | පහළ යයි |
| (5) පහළ යයි | ඉහළ යයි | ඉහළ යයි |

30. කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියක නිමැවුම ශුන්‍ය වන විට මුළු පිරිවැය (TC) රු. 180 ක් වේ. ඒකක 12ක් නිපදවීමේදී මුළු පිරිවැය රු. 720 ක් වේ. නම් එම නිමැවුම් මට්ටමේදී සාමාන්‍ය විචල්‍ය පිරිවැය වනුයේ

(1) රු. 15කි. (2) රු. 30කි. (3) රු. 45කි.
(4) රු. 60කි. (5) රු. 75කි.

31. දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලියක සාමාන්‍යය මුළු පිරිවැය (ATC) පහළ යාමට හේතුව වනුයේ,

(1) අඩුවන පරිමාණානුකූල ඵල ය
(2) පරිමානානුකූල පිරිමැසුම් ය
(2) හීනවන ආන්තික ඵලදායිතාව ය
(4) තාක්ෂණික නොපිරිමැසුම් ය
(5) අලෙවිකරණ නොපිරිමැසුම් ය


32. කිසියම් ආයතනයක නිමැවුම හා පිරිවැය පිළිබඳ පහත දැක්වෙන තොරතුරු සපයා ඇත.

| නිමැවුම් ඒකක | මුළු පිරිවැය |
|---|---|
| 0 | 200 |
| 1 | 360 |
| 2 | 380 |
| 3 | 390 |
| 4 | 410 |

ඉහත ආයතනයේ නිමැවුම් ඒකක 4ක් වනවිට සාමාන්‍ය ස්ථාවර පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) 50; 52.50 යි (2) 40; 42 යි (3) 100; 52.50 යි
(4) 200; 280.50 යි (5) 80; 110.20 යි

33. රූප සටහනෙහි දැක්වෙන්නේ ප්‍රාග්ධනය හා ශ්‍රමය ඇතුළු සියළුම නිෂ්පාදන සාධකවල සේවා නියුක්තිය වැඩිකරන විට ආයතනයේ සාමාන්‍ය මුළු පිරිවැය වෙනස්වන ආකාරයයි.




ආයතනය තම නිමැවුම $0Q_1$ සිට $0Q_2$ දක්වා වැඩි කරන විට රූප සටහන පෙන්නුම් කරන්නේ,

(1) ඒකාධිකාරී බලය නිසා හටගනා ප්‍රතිලාභයන්ය
(2) විශේෂ ප්‍රාගුණ්‍යය ඉහළ යාම නිසා හටගන්නා ප්‍රතිලාභයන් ය
(3) පරිමාණුකූල නොපිරිමැසුම්ය
(4) වැඩිවන පරිමාණුකූල ඵලය
(5) නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ යාමත්ය.

34. එක්තරා නිෂ්පාදන ආයතනයක්, X නැමති භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා ස්ථාවර ප්‍රාග්ධන යෙදවුම් ප්‍රමාණයක් සමග විචල්‍ය ශ්‍රම යෙදවුම් ප්‍රමාණයක් සේවා නියුක්ත කරයි. මෙහිදී ශ්‍රමයට ගෙවනු ලබන දෛනික වැටුප ඉහළ නැගුණහොත්, එම වැටුප් ඉහළ යාම ආයතනයේ නිෂ්පාදන පිරිවැය මත කෙලෙස බලපානු ලැබේ ද?

| | මුළු විචල්‍ය පිරිවැය | මුළු ස්ථාවර පිරිවැය | මුළු පිරිවැය |
|---|---|---|---|
| (1) | අඩුවේ | වෙනස් නොවේ | අඩුවේ |
| (2) | අඩුවේ | අඩුවේ | අඩුවේ |
| (3) | වැඩි වේ | අඩුවේ | වෙනස් නොවේ |
| (4) | වැඩි වේ | වෙනස් නොවේ | වැඩි වේ |
| (5) | වැඩි වේ | වැඩි වේ | වැඩි වේ |

35. පූර්ණ තරඟකාරී වෙළඳපොළක් තුළ කටයුතු කරන නිෂ්පාදන ආයතනයක අයභාරය නිවැරදිව දැක්වෙනුයේ පහත සඳහන් කවර ප්‍රකාශනයකින්ද?
(1) එය ස්ථාවර අගයක් ගනී
(2) අලෙවි කළ නිමැවුම් ප්‍රමාණය වැඩිවෙත් ම එය ඉහළ නගී.
(3) අලෙවි කළ නිමැවුම් ප්‍රමාණය වැඩිවෙත් ම එය පහළ බසී
(4) එය මුල දී ඉහළ ගොස් පසුව පහළ බසී
(5) එය මුල දී පහළ බැස පසුව ඉහළ නගී

36. නිමැවුම් ඒකක 20ක දී සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු. 15කි. මුළු පිරිවැය රු. 500 කි. නිමැවුම ඒකක 40 දක්වා වැඩි කිරීමේ දී ආන්තික පිරිවැය රු. 10 කි. ඒකක 40 ක් නිපදවන ඉවට සාමාන්‍ය විචල්‍ය පිරිවැය වනුයේ,
(1) රු. 10.00 කි (2) රු. 12.50 කි (3) රු. 15.00 කි
(4) රු. 17.50 කි (5) රු. 20.00 කි

37. කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය වක්‍රවල ස්වරූපය පිළිබඳ ව පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය අතර සිරස් දුර මගින් දැක්වෙන්නේ මුළු ස්ථාවර පිරිවැය වේ.
(2) මුළු පිරිවැය වක්‍රයේ බෑවුම මගින් දැක්වෙන්නේ ආන්තික පිරිවැයයි
(3) මුළු පිරිවැය වක්‍රයේ ඕනෑම ලක්ෂ්‍යයකට මූල ලක්ෂ්‍යයේ සිට අඳිනු ලබන සරල රේඛාවක බෑවුම මගින් ආන්තික පිරිවැය දැක්වේ.
(4) මුළු විචල්‍ය පිරිවැය වක්‍රයේ කිසියම් ලක්ෂ්‍යයකට මූලයේ සිට අඳිනු ලබන සරල රේඛාවක බෑවුම මඟින් සාමාන්‍ය ස්ථාවර පිරිවැය දැක්වේ.
(5) නිමවුම වැඩි කරන විට සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රය පහළට බෑවුම් වී නැවත ඉහළට බෑවුම් වේ.

38. පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?
(1) පහළට බෑවුම් වූ වෙළඳපොළ ඉල්ලුම් වක්‍රයක් පැවතීම
(2) සෑම ආයතනයක් ම පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයකට මුහුණ පා සිටීම
(3) සෑම ආයතනයක ම ආන්තික අයභාරය මිලට සමාන වීම
(4) දිගු කාලීන ව ආර්ථික ලාභ පැවතීම
(5) ආයතනය මිල ගනුවකු වීම

39. දළ දේශීය නිෂ්පාදිතය,
(1) දෙන ලද වර්ෂය තුළ ගණුදෙණු කරනු ලැබූ මුළු භාණ්ඩ හා සේවා ප්‍රමාණයේ වටිනාකමට සමාන වේ.
(2) දෙන ලද වර්ෂය තුළ මිල දී ගනු ලැබූ ව්‍යාපාරික කොටස් හෝ අලෙවි කරන ලද බැඳුම්කර හෝ වැනි මූල්‍ය ගනුදෙනුවලින් සමන්විත වේ.
(3) ගණනය කිරීමේ දී, අතරමැදි නිෂ්පාදන අදියරයන්හි දී මිල දී ගනු ලැබූ භාණ්ඩ ද ඇතුළත් කෙරේ.
(4) දෙන ලද වර්ෂය තුළ දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලැබූ, සියලු ම අවසාන භාණ්ඩ හා සේවා සඳහා වැය කරන ලද මුළු වියදම්වල එකතුවට සමාන වේ
(5) දෙන ලද වර්ෂය තුළ නිෂ්පාදනය කරන ලද සියලු ම භාණ්ඩ හා සේවාවලින් සමන්විත වේ.

40. ව්‍යාපාර චක්‍රයක ප්‍රසාරණාත්මක අදියරේ දී සිදු වීමට බොහෝ සෙයින් ඉඩකඩ ඇත්තේ,
(1) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම සහ සේවා වියුක්තිය අඩු වීමය.
(2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම සහ විරැකියාව ඉහළ යාමය.
(3) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පහළ වැටීම සහ උද්ධමනය ඉහළ යාමය.
(4) පොලී අනුපාතික ඉහළ යාම සහ බිඳ වැටෙන ව්‍යාපාර සංඛ්‍යාව ඉහළ යාමය.
(5) උද්ධමනය ඉහළ යාම සහ සේවා නියුක්තිය පහළ යාමය.

41. දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී පහත සඳහන් දෑ අතුරෙන් එක් අයිතමයක් හැර අන් සියල්ලම බැහැර කෙරේ. එලෙස බැහැර නොකෙරෙන අයිතමය වනුයේ,

(1) අතරමැදි භාණ්ඩවල වටිනාකමය
(2) සලකා බලන වර්ෂය තුළ ඉදිකරන ලද සියළුම නිවාසවල වටිනාකමය
(3) පාවිච්චි කරන ලද භාණ්ඩවල වටිනාකමය
(4) ශුද්ධ වශයෙන් මූල්‍යමය ස්වරූපයක් ගන්නා ගණුදෙනුය.
(5) ආණ්ඩුවෙන් ලබා දෙන සහනාධාරය

42. පහත සඳහන් සංරචක අතුරින් රටක නිමැවුම් මට්ටම ඉහළ නැංවීමට බලපාන වසාගත් සාධකයක් වන්නේ,

(1) දේශීය ඉතුරුම් වැඩි කිරීම ය
(2) රාජ්‍ය බදු ඉහළ නැංවීමය
(3) ආනයන භාණ්ඩ වැඩි කිරීම ය
(4) රාජ්‍ය සහනාධාර පහළ දැමීම ය
(5) රජයේ පරිභෝජන වියදම් ඉහළ නැංවීම ය

43. කිසියම් ආර්ථිකයක පවතින්නේ A, B හා C නැමැති ව්‍යාපාර තුන පමණි. A ආයතනය රු. 25 000 ක නිමැවුමක් ද, B ආයතනය රු. 20 000 ක නිමැවුමක් ද, C ආයතනය රු. 15 000 ක නිමැවුමක් ද නිපදවනු ලබයි. එහිදී A ආයතනය B ආයතනයෙන් රු. 5 000 ක යෙදවුම් හා C ආයතනයෙන් රු. 3 000ක යෙදවුම් ද, B ආයතනය A ආයතනයෙන් රු. 4 000 යෙදවුම් ද C ආයතනයෙන් රු. 5 000 ක යෙදවුම් ද ලබා ගනී. C ආයතනය A ආයතනයෙන් පමණක් රු. 8 000 ක යෙදවුම් ලබා ගනී. මෙම තොරතුරු අනුව ආර්ථිකයේ එකතු කළ අගය මත නිමැවුමේ අගය වන්නේ,

(1) 45 000 කි (2) 35 000 කි (3) 25 000 කි
(4) 15 000 කි (5) 10 000 කි

44. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය + ශුද්ධ අපනයන + තොග වෙනස්වීම සමාන වන්නේ,

(1) දළ දේශීය ඉතුරුම් වලට ය
(2) දළ දේශීය වියදමටය
(3) දළ දේශීය ආයෝජනයට ය
(4) දළ දේශීය නිෂ්පාදිකය මත වියදමට ය
(5) දළ ජාතික ඉතුරුම් වලටය

45. ආර්ථික වෘද්ධිය සාමාන්‍යයෙන් මිනුම් කරනුයේ,

(1) නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මඟිනි
(2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මඟිනි
(3) නාමික ප්‍රති ශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මඟිනි
(4) ප්‍රතිශීර්ෂ වැය කළ හැකි ජාතික ආදායමේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මඟිනි
(5) ක්‍රය ශක්ති සාම්‍ය ප්‍රති ශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මඟිනි

46. අවසාන නිෂ්පාදන ක්‍රමයට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම සඳහා භාවිතා කරන සංරචක නිවැරදි ව දැක්වෙන්නේ කවර පිළිතුර මඟින් ද?

(1) ප්‍රාග්ධන භාණ්ඩ, පරිභෝජන භාණ්ඩ හා අන්තර් භාණ්ඩවල තොග වෙනස් වීම
(2) ප්‍රාග්ධන භාණ්ඩ, අන්තර් භාණ්ඩ හා සේවා නිෂ්පාදිත
(3) පරිභෝජන භාණ්ඩ, ආයෝජන භාණ්ඩ හා සේවා නිෂ්පාදික
(4) පරිභෝජන භාණ්ඩ, ආයෝජන භාණ්ඩ හා අවසන් නිෂ්පාදිත වල වටිනාකම්
(5) කෘෂිකාර්මික භාණ්ඩ, කාර්මික භාණ්ඩ හා සේවා නිෂ්පාදිත

47. නිෂ්පාදන ක්‍රමයේ ගිණුම් තුළ ඇතුළත් 'එකතු කළ අගය' ලෙස සැලකෙන්නේ,

(1) කෘෂිකාර්මික, කාර්මික හා සේවා නිෂ්පාදිතයන්ගේ වටිනාකම්
(2) සාධක සඳහා ගෙවීම් හා ප්‍රාග්ධන ක්ෂය වීම්
(3) ශුද්ධ අපනයන හා සාධක සඳහා ගෙවීම්
(4) සාධක සඳහා ගෙවීම් හා යෙදවුම් පිරිවැය
(5) සාධක ආදායම්, ප්‍රාග්ධන ක්ෂය හා ශුද්ධ අපනයන

48. ගෙවුම් ශේෂ ලේඛනයේ වෙළඳ ගිණුමේ හා සේවා ගිණුමේ හිඟයන් පවතින විට, එම තත්ත්වය දේශීය නිමැවුම හා දේශීය ඉතුරුම් සම්බන්ධයෙන් කවර බලපෑමක් ඇති කරයි ද?

| | දේශීය වියදමට සාපේක්ෂව දේශීය නිමවුම | දළ ආයෝජනයට සාපේක්ෂව දේශීය ඉතුරුම් |
|---|---|---|
| 1) | පහළ යයි | ඉහළ යයි |
| 2) | පහළ යයි | පහළ යයි |
| 3) | ඉහළ යයි | පහළ යයි |
| 4) | ඉහළ යයි | ඉහළ යයි |
| 5) | පහළ යයි | වෙනස් නොවේ |

49. ශුද්ධ දේශීය ආදායම තුළින් වෙළෙඳ පොළ මිලට දළ ජාතික ආදායම ලබා ගැනීම සඳහා කළ යුතු ගැලපීම් වන්නේ,

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (1) | + | ශුද්ධ වක්‍ර බදු | + | ප්‍රාග්ධන ක්ෂය | + | ශුද්ධ අපනයන |
| (2) | - | ශුද්ධ වක්‍ර බදු | + | ශුද්ධ අපනයන | + | විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම |
| (3) | - | ප්‍රාග්ධන ක්ෂය | - | ශුද්ධ වක්‍ර බදු | + | ශුද්ධ අපනයන |
| (4) | + | ශුද්ධ වක්‍ර බදු | + | ප්‍රාග්ධන ක්ෂය | + | විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම |
| (5) | - | ප්‍රාග්ධන ක්ෂය | + | ශුද්ධ අපනයන | + | විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම |

50. වැය කළ හැකි දළ ජාතික ආදායම ලබා ගැනීමට දළ දේශීය වියදමට ගැලපිය යුත්තේ,

1) වෙළෙඳ ගිණුමේ ශේෂයයි
2) සේවා ගිණුමේ ශේෂයයි
3) ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂයයි
4) ජංගම සංක්‍රාම ගිණුමේ ශේෂයයි
5) වර්තන ගිණුමේ ශේෂයයි

ද මැසිනොද් විදුහල, කඳාන

පළමු වාර පරීක්ෂණය 2016 ජූලි

12 වසර වාණිජ සහ කලා ශ්‍රේණි සඳහා

12 ශ්‍රේණියේ ආර්ථික විද්‍යාව

Learning Resource Center R De Mazenod College Kandana

ආර්ථික විද්‍යාව II 2016. 07. 27 පැ තුනයි

"අ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද "ආ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## "අ" උප කොටස

01. (i) ආර්ථික සම්පත් යනු මොනවා ද? භූමිය ආර්ථික සම්පතක් වශයෙන් සැලකීම සඳහා ඔබ සතු තර්ක කිසිවක් තිබේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) ස්වාභාවික ප්‍රාග්ධනය යනු කුමක් ද? ආර්ථික විද්‍යාවේදී මුදල් ප්‍රාග්ධනය ලෙස නොසැලකෙන්නේ ඇයි? (ලකුණු 04)

(iii) ව්‍යවසායකයා ගේ ප්‍රධානම කාර්යයන් නම් කරන්න. (ලකුණු 03)

(iv) (අ) කාර්යක්ෂමතාවය යනු කුමක් ද? (ලකුණු 02)

(ආ) නිෂ්පාදන හැකියා වක්‍රය මත පිහිටි සියලුම ලක්ෂ්‍යයන් ආර්ථික කාර්යක්ෂමතාවය අතින් එක හා සමානතාවයක් පෙන්නුම් කරන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) ව්‍යාපාර චක්‍රයක විභව නිමැවුම (උපනති රේඛාව) හා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04)

02. (i) ආර්ථික පද්ධති වර්ග කිරීමට යොදා ගැනෙන නිර්ණායක අනුව විකල්ප ආර්ථික පද්ධති හඳුනාගත හැකිය. මෙම නිර්ණායක මුල් කරගෙන වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක ප්‍රධාන ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03)

(ii) "වෙළෙඳ පොළ ආර්ථිකයක් සැම විටම සමාජ සුභසාධනය සඳහා ක්‍රියාත්මක වේ" මෙම ප්‍රකාශය විමසන්න. (ලකුණු 04)

(iii) "සමාජයීය වෙළෙඳපොළ ආර්ථිකයක්" යනු කුමක් දැයි නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iv) ආර්ථික පද්ධතියක

(අ) ආදායම් බෙදීයාම පිළිබඳ ප්‍රශ්නය

(ආ) නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය

(ඉ) සම්පත් බෙදා වෙන් කිරීම පිළිබඳ ප්‍රශ්නය සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(v) (අ) සාම්ප්‍රදායික ආර්ථික පද්ධතිය

(ආ) නව සාම්ප්‍රදායික ආර්ථික පද්ධතිය

නිදසුන් දෙමින් මේවා පැහැදිලි කරන්න. (ලකුණු 04)

03. (i) වෙළෙඳපොළක කිසියම් භාණ්ඩයක් සපයනු ලැබේ යැයි සඳහන් කළ විට ඉන් හැඟවෙන කරුණු කවරේ ද? (ලකුණු 03)


(ii) පහළ මිලකදී ට වඩා ඉහළ මිලකදී සපයනු ලබන ප්‍රමාණය ඉහළ නගින්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) (අ) නිෂ්පාදන ආදේශකයක මිල ඉහළ යාමකදී සලකා බලන භාණ්ඩයේ සැපයුම් වක්‍රයට ඇතිවන බලපෑම

(ආ) සලකා බලන භාණ්ඩයේ මිල ඉහළ යාමකදී බද්ධ නිෂ්පාදිතයක සැපයුම් වක්‍රයට ඇතිවන බලපෑම වෙන් වෙන් වශයෙන් රූප සටහන් මගින් දක්වන්න. (ලකුණු 04)

(iv) වෙළෙඳ පොළක පෞද්ගලික සැපයුම් වක්‍රය සහ වෙළෙඳපොළ සැපයුම් වක්‍රය අතර සම්බන්ධතාව නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(v) මතු දැක්වෙන සැපයුම් වක්‍රවල ඡේදන ලක්ෂ්‍යයේ දී සැපයුම් නම්‍යතාවය පිළිබඳව ඔබට කුමක් කිව හැකි ද? (ලකුණු 04)




04. (i) ස්ථායි සමතුලිතතාවක් ඇති වෙළෙඳ පොළක් යන්නෙන් කවරක් අදහස් වේ ද? රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) (අ) වෙළෙඳපොළ තීරණය වූ මිල, නිෂ්පාදකයාට සාධාරණ නොවන විට එය මඟ හැරවීම සඳහා රජය මැදිහත්වන ආකාර කවරේ ද? (ලකුණු 02)

(ආ) ඒවායේ ආර්ථික ප්‍රතිවිපාක දෙක බැගින් දෙන්න. (ලකුණු 04)

(iii) එක්තරා භාණ්ඩයක වෙළෙඳපොළ සමතුලිත මිල රු. 100 ක් වන අතර සමතුලිත ප්‍රමාණය ඒකක 1000කි. සමතුලිත මිලේදී ඉල්ලුම් නම්‍යතාවය සහ සැපයුම් නම්‍යතාවය 1.0 කි.

(අ) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය කීය ද? (ලකුණු 04)

(ආ) මෙම භාණ්ඩය සඳහා ඒකකයකට රු. 10 ක නිෂ්පාදන සහනාධාරයක් රජය විසින් දෙන ලද නම්

(a) සහනාධාරයට පසු පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්ත කොපමණ වේ ද? (ලකුණු 04)

(b) රජයේ සහනාධාර වියදම කිය ද? (ලකුණු 01)

(c) අහිමි වන සමාජ සුභසාධනය කොපමණ ද? (ලකුණු 01)

## "ආ" උප කොටස

05. (i) ඍජු පිරිවැය සහ ආරෝපිත (වක්‍ර) පිරිවැය අතර වෙනස එක එකක් සඳහා උදාහරණය බැගින් දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 04)

(ii) ආර්ථික විද්‍යාඥයන් ප්‍රාමාණික ලාභය පිරිවැයක් ලෙස සලකනු ලබන්නේ ඇයි? (ලකුණු 04)

(iii) ලාභ උපරිමනය කිරීමේ නීතිය යනු කුමක් ද? මිල ගනුවෙක් වශයෙන් ක්‍රියාකරන නිෂ්පාදන ආයතනයක් සම්බන්ධයෙන් එම නීතිය ප්‍රකාශ කළ හැක්කේ කෙසේ ද? (ලකුණු 04)


(iv) ස්වාභාවික ඒකාධිකාරය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(v) සැකෙවින් පැහැදිලි කරන්න.

(අ) පරිමාණුකූල ඵල නීතිය (ලකුණු 02)

(ආ) හීනවන ඵල නීතිය (ලකුණු 02)

06. (i) පූර්ණ තරඟකාරී ආයතනයක් මුහුණ දෙන කෙටිකාලීන පිරිවැය හා අයභාර වක්‍ර පහත රූප සටහනෙහි දැක්වේ.




(අ) මෙම ආර්ථිකය සමතුලිතයේදී ආර්ථික ලාභය කොපමණ ද? (ලකුණු 02)

(ආ) ආයතනයේ මුලු ස්ථාවර පිරිවැය කොපමණ ද? (ලකුණු 02)

(ඉ) ආයතනය කර්මාන්තයෙන් ඉවත් වීමට තීරණය කළ යුත්තේ මිල කවර මට්ටමකට වඩා පහළ යන්නේ නම් ද? (ලකුණු 01)

(ii) ආර්ථික ලාභ ශුන්‍ය මට්ටමක පැවතියත් නිෂ්පාදන ආයතන අඛණ්ඩව නිෂ්පාදනයේ යෙදී සිටින්නේ ඇයි? (ලකුණු 02)

(iii) නිෂ්පාදන අතිරික්තය සහ ආර්ථික ලාභය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04)

(iv) සැකෙවින් පැහැදිලි කරන්න.

(අ) ක්‍රම ක්ෂය ගාස්තු (ආ) ගිළුණු පිරිවැය (ඉ) අවම ප්‍රශස්ථ ධාරිතාව (ලකුණු 06)

(v) පූර්ණ තරඟය සහ ඒකාකාර තරඟය යන වෙළෙඳපොළ ස්වරූප දෙකෙහි පිරිවැය දෙකෙහි අසමානකම් තුනක් දෙන්න. (ලකුණු 03(

07. (i) ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ක්‍රම වේදයේ සිදු කරන ලද ප්‍රධාන වෙනස්කම් 3 ක් දක්වන්න. (ලකුණු 03)

(ii) නව ක්‍රමවේදයට අනුව ආර්ථික කටයුතු වල නියුක්ත ප්‍රධාන අංශ කවරේ ද? (ලකුණු 04)

(iii) 2015 වසරේ දී ශ්‍රී ලංකාවේ මුලු පෞද්ගලික පරිභෝජන වියදම සඳහා දායක වූ ප්‍රධාන භාණ්ඩ කාණ්ඩ දෙක කවරේ ද? (ලකුණු 02)

(iv) ගෙවුම් තුලනයේ ජංගම ගිණුම සහ ජාතික ගිණුම අතර සම්බන්ධතාවය දක්වන නිදසුන් තුනක් දෙන්න. (ලකුණු 06)

(v) (අ) දල දේශීය ප්‍රාග්ධන සම්පාදනයට වැයවන ප්‍රධාන වියදම් වර්ග දෙක කවරේ ද? (ලකුණු 02)

(ආ) සැකෙවින් පැහැදිලි කරන්න.

(a) මූලික මිල

(b) නිෂ්පාදකයන්ගේ මිල

(c) ගැණුම්කරුවන්ගේ මිල (ලකුණු 03)

08. (i) 2015 වසර සඳහා එක්තරා කල්පිත ආර්ථිකයක් පිළිබඳ දත්ත රැසක් පහත දැක්වේ.

| | රුපියල් බිලියන |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | 100 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 70 |
| රජයේ පරිභෝජන වියදම | 60 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 30 |
| අවසාන පරිභෝජනය | 160 |
| භාණ්ඩ හා සේවා ආනයන | 50 |
| විදේශීය ප්‍රාථමික ආදායම් ලැබීම් | 40 |
| විදේශීය ප්‍රාථමික ආදායම් ගෙවීම් | 60 |
| විදේශ ජංගම සංක්‍රාම ශුද්ධ ශේෂය | +40 |
| තොග / පරිලේඛණ වෙනස්වීම් | -5 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | +20 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු (සහනාධාර අඩු කොට) | +10 |

මතු දැක්වෙන දෑ ගණනය කරන්න.

(අ) වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය

(ආ) වෙළෙඳපොළ මිල අනුව දළ ජාතික ආදායම

(ඉ) වැය කළ හැකි දළ ජාතික ආදායම

(ඊ) මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය

(උ) ජාතික ඉතිරුම් හා දේශීය ඉතිරුම් (ලකුණු 10)

(ii) (අ) ඔබ ආයෝජන අනුපාතිකය ගණන් බලන්නේ කෙසේ ද? (ලකුණු 02)

(ආ) 2015 දී ශ්‍රී ලංකාවේ ආයෝජන අනුපාතිකය කීය ද? (ලකුණු 02)

(iii) සැකෙවින් පැහැදිලි කරන්න.

(අ) නොවිධිමත් ආර්ථික ක්‍රියා (ආ) සැඟවුනු ආර්ථික ක්‍රියා (ලකුණු 04)

(iv) ජාතික ගිණුම්කරණයේදී රාජ්‍ය ණය සඳහා පොළී සංක්‍රාම ලෙස බැහැර කරන්නේ ඇයි ? (ලකුණු 02)